# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

## පුස්තකාල හා විඥාපන විද්‍යාව

**පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාවය හා තොරතුරු කුසලතා**
**LISC – 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය විසින් පැරණි ලෝකයේ පුස්තකාල හා ලේඛන කලාවේ සංවර්ධනය උදෙසා කළ දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

02. නූතන මුද්‍රණ ශිල්පයේ තිබෙනවාටත් වඩා ශාස්ත්‍රීය බවක් අපගේ ඓතිහාසික සම්පතක් වූ පුස්කොළ ලේඛනය තුළ දැකිය හැකිය. නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. අපගේ සංස්කෘතික උරුමය මතු පරපුර සඳහා දායක කිරීමේ කාර්යයේදී මහජන පුස්තකාල සතු භූමිකාව විමසීමට ලක් කරන්න. (ලකුණු 20)

04. පුස්තකාල හා විඥාපන විද්‍යාව පෙරදිග ලෝකයට උරුමකරලීමේ කාර්යයේදී විශිෂ්ටතම සේවාවක් කලේ එස්.ආර්.රංගනාධන්ය. එස්.ආර්. රංගනාධන්ගේ දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

05. සාම්ප්‍රදායික පුස්තකාල ද්‍රව්‍ය අභිබවා අන්තර්ජාලය මෙරට පැමිණිය ද තොරතුරු ගවේෂණයේදී අන්තර්ජාලය හා බැඳී පවතින දුෂ්කරතා පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

06. තොරතුරු සමුද්ධරණ කාර්යයේදී ග්‍රන්ථ නාමාවලියකට වඩා වැඩි මෙහෙයක් අනුක්‍රමණිකා තුළින් සිදුවේ. සංසන්දනාත්මකව ඇගයීමක් කරන්න. (ලකුණු 20)

07. පැරණි ලංකාවේ පුස්තකාල සංවර්ධනයට බලපෑ එක් හේතුවක් වූයේ රාජ්‍ය අනුග්‍රහයයි. නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. කාඩ්පත් සූචිය
    ii. මලවුන්ගේ ග්‍රන්ථය
    iii. පැපිරස්
    iv. කොංග්‍රස් පුස්තකාලය
    v. වෙළඳ ග්‍රන්ථ නාමාවලී (ලකුණු 05x4=20)

*************************************